

ලංකාදීප
සඳැල්ල
2022 දෙසැම්බර් 18
අකීල – ශලනි
ඡායාරූපය - සජීව ලක්ෂාන්
පිටු සැකසුම - පසන් සෙනෙවිරත්න


# යකින්න අම්මා කෙනෙක් වෙලානෙ

## කෑමට වාරණ දාන්න බෑ ඒ නිසා ව්‍යායාම කළා



'ගින්දරී - 3' ෆිල්ම් එක මේ දිනවල ගින්දර වගේ කියලා තමයි නරඹන බොහෝ දෙනා කියන්නේ. මොන ප්‍රශ්න තිබුණත් ඒවා මොහොතකට පැත්තකට දාලා, ඇවිත් මිනිස්සු මේ ෆිල්ම් එක නැරඹීම ඊට හේතුවයි. මේ විදියට සාර්ථකව තිරගත වන 'ගින්දරී' ෆිල්ම් එක ෂූටිං කරද්දී ගින්දරීව, එහෙමත් නැත්නම් පබෝදා සංදීපනීට ප්‍රේක්ෂකයන්ගෙන් නම් ගැලවීමක් ලැබුණෙ නැහැ. මොකද මේ ෆිල්ම් එකේ වැඩි හරියක් දර්ශන රූගත කළේ කොටුව සහ කොළඹ නගරය ඇතුළතදීයි. මීට පෙර 'බහුභූතයෝ', 'ගින්දරී - 2' නරඹා සිටි ප්‍රේක්ෂකයින්ට පබෝදා කියන්නේ තවත් අලුත් රූපයක් නොවෙයිනෙ. ඒ නිසා 'ගින්දරී - 3' මේ විදියට කොළඹ නගරයේ රූගත කිරීම් කරද්දී මේ චිත්‍රපටයේ අධ්‍යක්ෂවරයා වන උදයකාන්ත මෙන්ම නිෂ්පාදන කණ්ඩායම මුහුණ දුන්නේ දැඩි අසීරුතාවකටලු. ඒ කියන්නේ ෂූටිං පටන් ගත්ත හැටියෙ ගින්දරී කොටුවෙ පාරවල්වල යද්දී, මිනිස්සු වටකර ගත්තාලු 'ආනේ... මේ අපේ ගින්දරීනෙ' කියලා. එක අතකට මේ විදියට ගින්දරී ෂූටිං කරන අවස්ථාවේ ගින්දරී ඇතුළු නළු නිළි පිරිස දැක ගන්න මිනිස්සු පොදි ගැසීම සිනමාවේ රසිකත්වයෙ සුබ ලකුණක්. සාමාන්‍යයෙන් චිත්‍රපටයක් නැරඹීමට මිනිස්සු පැමිණියද, ෂූටිං නරඹන්න එන්නේ ඉතාම සුළු පිරිසක්. ඒත් ගින්දරී ෂූටිං නරඹන්න නම් සෑහෙන පිරිසක් ඇවිත් තිබුණා. මේ සියලු දේ ගින්දරීට දැනෙන්නෙ මොන විදියටද? ඒ කියන්නේ පබෝදා සංදීපනී රංගන ශිල්පිනියට දැනෙන්නෙ කොහොමද? මේ පිළිසඳර පබෝදා එක්කයි.





**• පබෝදා, ගින්දරී කියනවට ආසද?**

ඒක ඉතින් ෆිල්ම් එකනෙ.

**• 'බහුබූතයෝ', ඊට පස්සේ ඒකෙ දෙක ලෙස ආ 'ගින්දරී' සහ දැන් 'ගින්දරී - 3' අතරින් පබෝදාට හොඳම මතකය තියෙන්නේ මොන රඟපෑමේදී ද?**

මම හිතන්නෙ පළවැනි එකේ. 'බහුබූතයෝ' මගේ පළවැනි අත්දැකීමනෙ. ඒකෙ කවුරුත් මේ විදියට චරිත ගැන දැනගෙන හිටියේ නැහැනෙ. ඉතින් එදා ෂූටිං කරද්දි රෙද්ද හැට්ටය ඇඳගෙන පාරවල යද්දි මිනිස්සු ඔක්කෝම විපරම් කරන්න පටන් ගත්තා කවුද මේ විදියට පාරේ යන්නේ කියලා? මේ ගෑනු ළමයට පිස්සුද කියලා තමයි බැලුවෙ. ඉතින් ඒ නිසා එදා මාත් බොහොම අපහසුතාවයෙන් කළේ. කැමරාවක්වත් පේන්න නැතුව තමයි ෂූටිං කළේ. වෑන් එකෙන් බැහැල යන්න කිව්වාම ගියා. ඉතින් මිනිස්සු එදා හිතන්න ඇත්තෙ ඇත්තම කෙනෙක් කියලා වෙන්නැති.

**• 'ගින්දරී - 3' රඟපාද්දි මතකයන් ගැන කියමු?**

මෙහෙමයි. 'බහුබූතයෝ' සහ ඊට පස්සෙ ඒකෙ දෙවැන්න ලෙස 'ගින්දරී' ආවාම මිනිස්සු හැමෝම වගේ කවුද මේ ගින්දරී සහ ඒකෙ අනෙක් චරිත ගැන දැන ගත්තා. එතකොට අර පළවැනි එකේදී වගේ ෂූටිං නරඹන්න කුතුහලය තිබූ මිනිසුන්ට වඩා, වැඩි පිරිසක් ෂූටිං කරන හැටි නරඹන්න ආවේ චරිත ගැන දැනගෙනයි. එයාලා දන්න ශිල්පීන් දැක ගැනීමේ ආසාවෙන් තමයි ඒ විදියට එන්න ඇත්තෙ. ඒ නිසාම නිෂ්පාදන කණ්ඩායම අපහසුතාවට පත්වෙන්න ඇති. කොහොම වුණත් 'ගින්දරී' වටා වගේම සිනමාව වටා ප්‍රේක්ෂකයන් එක්වීම හොඳ දෙයක්.

**• පබෝදා මේකෙ ගීතය වෙනුවෙන් කොච්චර දවසක් ෂූටිං කළාද?**

මට මතක විදියට දවස් දෙකක් විතර ඒ දර්ශන පෙළ ෂූට් කළා.

**• මුළු චිත්‍රපටය පුරාවටම රෙද්ද - හැට්ටය ඇඳගෙන ඉන්නෙ නේද?**

ඔව්.

**• සැබෑ ජීවිතයේදී මගතොට යන එනකොට මිනිස්සු පබෝදා දිහා බලන්නෙත් තිගැස්මකින්ද?**

'බහුබූතයෝ' චිත්‍රපටයෙන් පසුව කොහොමටත් මට ඒ විදියෙ ප්‍රතිචාර ලැබුණා. සමහරු එක පාරටම මා එක්ක කතා කරන්න බයෙන් වගේ ටික වෙලාවක් ඉඳලා තමයි කතා කරන්නේ. පුද්ගලික වාහනයක කොහෙ හරි ගමනක් යද්දි ඒ වාහනයේ එන අය ටික වෙලාවක් යනකල් කතා කරන්නේ නැහැ. බයෙන් ඉඳලා තමයි කතා කරන්නේ.

**• ඒ වගේ දේ නිසා 'ගින්දරී - 3' බාරගන්න චකිතයක් තිබුණෙ නැද්ද? එකම චරිතය නිසා?**

ඒ ඒ කාලවලට අනුව ස්වරූපය සහ කතාව වෙනස් නිසා එහෙම ප්‍රශ්නයක් වුණේ නැහැ. යකින්න අම්මා කෙනෙකුත් වෙලානෙ දැන් ඉන්නේ. ඉතින් මේ චරිතය කරද්දි මට ලොකුම අභියෝගය වුණේ ඇඟ හදාගන්න එක. චිත්‍රපටයේ චරිතය ගැන කිව්වාම ඔන්න එතැන් සිට මම ආහාරපාන ගැන සැලකිලිමත් වෙන්න පටන් ගත්තා. ව්‍යායාම් තමයි වැඩිපුර කළේ. එහෙම නැතුව කෑම බීමවලින් මට ඇඟ පාලනය කර ගන්න නම් බැහැ. කෑමට වාරණ දාගෙන මට ඉන්න බැහැ.

**• පබෝදා අනුගමනය කරන විශේෂ කෑම වට්ටෝරුවක් තියෙනවද?**

එහෙම විශේෂයක්ම නැහැ. ව්‍යායාම් කරන කාලයේදී ඒ අනුව හැඩ ගැහෙනවා.

**• දිගටම ව්‍යායාම් කරන්නෙත් නැද්ද?**

එහෙම කරන්න බැහැ. වැඩත් එක්ක දිගටම කරන්න අමාරුයි. ව්‍යායාම් කළත් ගෙදරදි තමයි කරන්නෙ.

**• අද පබෝදා හඬකැවීම්වලට යන්නෙ නැද්ද?**

මොකද ඉස්සර පුංචි පබෝද සංදීපනී කියන්නේ හඬකැවීම් නිර්මාණවලට නැතුවම බැරි චරිතයක්නෙ.

ඉස්සර වගේ අද බොහෝ දේ කරන්නෙත් නැහැ ඉස්සර නම් රූපවාහිනියෙ වගේම අනෙක් නාලිකාවල බොහෝ හොඳ වැඩසටහන් කළානෙ. අද ඒ ප්‍රමාණය අඩු වෙලා. ඒ නිසා මට කතා කරන්නෙ බොහෝ විට හොඳ නිර්මාණයකට.

**• රොඩ්නි, මහේන්ද්‍ර වගේ ශිල්පීන් එක්ක රඟපාද්දි හිනාව නවත්වාගෙන රඟපාන්න පහසුද? ඒ අත්දැකීම මොන වගේද?**

හිනා යන අවස්ථා තියෙන බව ඇත්ත. ඒත් රඟපාද්දි ඒවා දැන් සුපුරුදු දේවල්. අනෙක් ශිල්පියාට අපහසුතාවක් ඇති නොවන විදියට රඟපාන්න අපි කවුරුත් වගබලා ගන්නවා. ඒත් ඉතින් සමහර තැන්වලදි අපට හිනා යන අවස්ථාත් තියෙනවා. දර්ශන තලයේදී ඒ විහිළු තහළු විඳිමින් තමයි අපි ඒ වැඩේ කරගෙන යන්නේ. ඒ සෑම දෙනෙකුගේම සහයෝගය රංගනයේදී එකිනෙකාට ලැබීම නිසාම තමයි චිත්‍රපටය මෙච්චර සාර්ථකව තිරගත වෙන්නෙත්. මගේ චරිතය ගැන කතා කළොත් මට අවශ්‍ය සියලු හැඩතල සහ වටපිටාව හදාගන්න අධ්‍යක්ෂවරයාගේ උපදෙස් සහ අනෙකුත් ශිල්පීන්ගෙ අවබෝධය එක්කයි. මොකද මේක ටීම් වර්ක් එකක්. ඒ කියන්නෙ කණ්ඩායමේම එකමුතුකම සහ අවබෝධය එක්ක කෙරෙන දෙයක්. අවුරුදු 20ක් තිස්සේ එකම චිත්‍රපටයක කණ්ඩායමක් මේ විදියට වැඩ කරනවා කියන්නෙම සතුටට කාරණයක්.

**• එදා 'බහුබූතයෝ' රඟපාද්දි තිබූ පෙනුමටත් වඩා පබෝදාගේ පෙනුම තවත් තුරුණු වෙලා.**

**මොකක්ද රහස?**

ඒක නම් දන්නෙ නැහැ. මහන්සි වෙලා වැඩ කිරීම නිසා වෙන්නැති.

**• විශේෂයෙන් ලස්සන වෙන්න කියලා රූපලාවන්‍ය එහෙම කරන්නෙ නැද්ද?**

අනේ නැහැ. ඔහේ හිනාවෙලා ඉන්නවා. ඒක තමයි මගේ විදිය.

**• පබෝදාගෙ අම්මා ගීතා කාන්ති ප්‍රවීණ ශිල්පිනිය එක්ක රඟපෑ නිර්මාණ මොනවද?**

ඉදිරියේදී අපි දෙන්නා රඟපෑ චිත්‍රපටයක් තිරගත වෙන්න තියෙනවා.

**• පබෝදා හොල්මන් විශ්වාස කරනවද?**

ටිකක් විතර විශ්වාස කරනවා.

**• හොල්මන් දැකලා නැද්ද?**

නැහැ.

**• යක්කුන්ට බයයිද?**

යක්කු කියන්නෙ හොල්මන් නෙවෙයිනෙ. අපේ ආදිකාලීන ගෝත්‍රයක්. ඒත් හොල්මන් කියන්නෙ වෙනස් දෙයක්. මැරිච්ච ආත්මවලටනෙ බොහෝ විට හොල්මන් කියන්නෙ.

**• කොහොමද 'ගින්දරී'ට ප්‍රතිචාර?**

ඉතාම හොඳයි. මොකද නිතරම හවුස් ෆුල්. ආසන නැතිකම නිසා සමහරු හිටගෙනත් ෆිල්ම් එක නරඹනවලු. 'බහුබූතයෝ' ෆිල්ම් එකේ සිට ආ ආකර්ශනය නිසා වෙන්නැති මේ තරම් ඉහළ ප්‍රතිචාර ලැබෙන්නෙ. මිනිස්සුන්ට ඒ විදිය කාවදින්න ඇති. එදා 'බහුබූතයෝ' හවුස් ෆුල් වෙලා ටිකට් නැතුව, නොමිලේම පෙන්නුව අවස්ථා තිබුණාය කියලා උදයකාන්ත මහතා කිව්වා. ඉතින් ඒ විදියට ආ ආකර්ශනය නිසා මේ ෆිල්ම් එක සාර්ථක වෙන්න ඇති. ඒ හැරත් ලෝකයේ එක දිගට චිත්‍රපටයක් කොටස් 1, 2, 3 විදියට නිර්මාණය වෙද්දි සමහර විට අසාර්ථක වෙනවා. ඒත් අපේ පුංචි ලංකාවේ සිනමාව පුංචි වුණාත් මේ චිත්‍රපටය වඩ වඩාත් ප්‍රේක්ෂක ආකර්ෂණාය දිනා ගැනීම ඇත්තටම ලොකු සතුටක්. එක අතකට ඒක වාර්තාවක්. අපේ සිනමාවේ ඒ වගේ දේ සිදුවීමම හොඳ දෙයක්.



**පබෝදා සංදීපනී**

සඳුන් ගමගේ

# Astra ගෙදර හදමු නත්තල් රස

## ඇස්ට්‍රා සමඟ නත්තල වෙනුවෙන් රසවත් සහ පහසු කෑම වට්ටෝරු

### නත්තල වෙනුවෙන්
## ඇස්ට්‍රාස්කොච් පුඩිං



**අවශ්‍ය ද්‍රව්‍ය**

| | |
|---|---|
| ඇස්ට්‍රා | ග්‍රෑම් 63 |
| කෝන්ෆලා | ග්‍රෑම් 30 |
| රතු සීනි | ග්‍රෑම් 100 |
| කිරි | මි.ලීටර් 473 |
| වැනිලා | මි.ලීටර් 5 |

**සාදන ක්‍රමය**

- කිරි හා කෝන්ෆලා හොඳින් මිශ්‍ර කර ගන්න
- සීනි භාජනයකට දමා ලිප තබා කැරමල් කර ගන්න
- සීනි හොඳින් දිය වූ පසු ඇස්ට්‍රා එකතු කර මිශ්‍ර කර ගන්න
- කිරි සමඟ දිය කර ගත් කෝන්ෆ්ලා මිශ්‍රණය එකතු කර අඩු ගින්දරේ හැඳි ගාමින් උකු මිශ්‍රණයක් සාදා ගන්න
- අවසානයට වැනිලා එක්කර හොඳින් මිශ්‍ර කර පිළිගන්වන බඳුන් වලට දමා ශීතකරණයේ විනාඩි 30 තබා සිසිල් කර සරසා රස බලන්න

### ඇස්ට්‍රා සමඟ
## ක්ලබ් සැන්ඩ්විච්



**අවශ්‍ය ද්‍රව්‍ය**

| | |
|---|---|
| පාන් පෙති | 6 |
| ඇස්ට්‍රා | ග්‍රෑම් 100 |
| තම්බාගත් කුකුළ් මස් | ග්‍රෑම් 20 |
| බිත්තර ඔම්ලට් | 1 |
| සළාද කොළ | 10 |
| ලොකු තක්කාලි පෙති | 2 |
| අබ පේස්ට් | තේ හැඳි 1 |
| රස කිරීමට ගම්මිරිස් | |
| රඳවා ගැනීමට ටූත් පික්ස් කිහිපයක් | |

**සාදන ක්‍රමය**

- මුලින්ම බඳුනකට ඇස්ට්‍රා, අබ පේස්ට්, ගම්මිරිස් හා කුකුළ් මස් මිශ්‍ර කර පෙති මත මිශ්‍රණය තවරා පැත්තකින් තබා ගන්න
- දෙවෙනි පාන් පෙත්ත මත ඔම්ලට්, තක්කාලි සහ ගම්මිරිස් තට්ටුවක් අතුරා ගන්න
- පාන් පෙති එක මත එක අතුරා අවසන් පාන් පෙත්ත උඩින් තබා ගෙන අවසන් කරගන්න
- ක්ලබ් සැන්ඩ්විච් එකේ කොන් කපා ටූත්පික් මගින් රඳවා ගන්න
- කොටු හතරකට කපා පිළිගන්වන්න

තවත් රසවත් කෑම වට්ටෝරු සහ විස්තර සඳහා AstraSriLanka වෙත පිවිසෙන්න.

# රංජිත් යළි “දුම්මල වරම” සමඟ




**2000 දශකයේ දී ඉතාම ජනප්‍රියත්වයට පත් වූ වේදිකා නාට්‍යයක් වන ‘දුම්මල වරම’ යළි නව නිෂ්පාදනයක් ලෙස ළඟදීම කරළියට ගෙන ඒමට මේ දිනවල පුහුණුවීම් කරගෙන යනු ලැබේ.**

ප්‍රවීණ නාට්‍යවේදී රංජිත් ද අල්විස් විසින් රචනා කොට, අධ්‍යක්ෂණය කරන මෙම නාට්‍යය මිත්‍යා විශ්වාස හා ඇදහිලි පිළිබඳ අසංදෘෂ්ඨික මතවාද පිළිබඳ මානවයා දැනුවත් කරන නිර්මාණයකි.

විල්සන් ගුණරත්න, සනත් විමලසිරි, මහින්ද පතිරගේ, මනෝහරි විමලතුංග, තාරක අධිකාරි, ජනක රණසිංහ, ඉසුරින්දි ජයසේකර, උපුල් වීරසිංහ, අනුර මාපිටිගම සමඟ භාග්‍යා මධුභාෂිණී මෙහි චරිත නිරූපණය කරති.

විශාරද එඩ්වඩ් ජයකොඩි විසින් සංගීත නිර්මාණය සහ සුගායනය කරන ‘දුම්මල වරම’ චමිල සංගීත්, බුද්ධික වික්‍රමතුංග සහ වසන්ත පෙරේරා වාද්‍ය වෘන්දයෙන් සහාය වෙති. තාරක අධිකාරි අංග රචනයෙන්




ද, චින්තක පතිරණ පිටපත සිහිපත් කිරීමෙන් ද, සුනිල් සමරසේකර රංගාලෝක සේවාවෙන් ද මීට එක්වෙති.

# ඉසිවර ගී ස්වර ටී.එන්.එල්. නාලිකාවේ

වෛද්‍ය තුසිත සුදර්ශන සමග සමිතා එරන්දතී, සුභානි හර්ෂනී, ශෂිකා නිසංසලා ගී ගැයූ ඉසිවර ගී ස්වර සංගීත ප්‍රසංගය දෙසැම්බර් 17 සෙනසුරාදා සවස 6.30 ට ටී.එන්. එල්. නාලිකාව ඔස්සේ විකාශය වේ. මෙම ප්‍රසංගය සංගීතවත් කළේ නවරත්න ගමගේය.

# හුස්මක්

## 21 දා නොමිලේ



**දේශීය සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් රාජ්‍ය සංගීත හා නර්තන කණ්ඩායම් එක්ව “හුස්මක්” නමින් සංස්කෘතික කලා ප්‍රසංගයක් මෙම 21 වැනිදා පස්වරු 6.00 ට කොළඹ නෙළුම් පොකුණ රඟහලේදී නොමිලේ පැවැත්වීමට කටයුතු යොදා තිබේ.**

රාජ්‍ය සංගීත කණ්ඩායම භාරව ශ්‍යාමා ඒකනායක කටයුතු කරන අතර, එහි උපදේශකවරයා ලෙස ජානක ෆොන්සේකා කටයුතු කරයි. රාජ්‍ය නර්තන කණ්ඩායම භාරව නදීරා කුමාරි කටයුතු කරන අතර, එහි උපදේශකවරයා ලෙස අජිත් අමරසිරි කටයුතු කරයි. මෙහිදී 1976 ප්‍රථම රාජ්‍ය සංගීත හා නර්තන කණ්ඩායම්හි මේ වනවිට ජීවත්ව සිටින සංගීත ක්ෂේත්‍රයේ රංජිත් බාලසූරිය, හෂිකා ගුණරත්න ඇතුළු ප්‍රවීණ සංගීත ශිල්පීන් කිහිපදෙනකුටත්, නර්තන ක්ෂේත්‍රයේ සුදත් චන්දන, ධනපාල රොද්‍රිගෝ, ජේ.පී. ජයතුරා ඇතුළු ප්‍රවීණ ශිල්පීන් කිහිපදෙනකුටත් ඇගැයීම් සිදුකිරීමට කටයුතු යොදා ඇති බව සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂිකා තරණි අනෝජා ගමගේ මහත්මිය ‘‘රසවින්දන’’ට පැවසුවාය.


ඔබ කෙට්ටුද ?
ස්ත්‍රී / පුරුෂ දෙපක්ෂයටම
ඔබගේ ශරීරයේ ඇති කෙට්ටු බව නවතා පිරිපුන් පැහැපත් සිරුරක් සඳහා ආරක්ෂාකාරී ප්‍රතිකාර ලබාගැනීමට
නිවසටම ගෙන්වා ගැනීමට හෝ පැමිණීමට
විමසීම් : 0714 520 418
පුරුෂ රෝග - ස්නායු, ධාතු දුබලතා, අප්‍රාණිකත්වය සඳහා විශේෂ ප්‍රතිකාර
අධික තරබාරුව, කාන්තා රෝග, හිසකෙස් රෝග, ගැස්ට්‍රයිටිස්, සියලු රෝග සඳහා පැමිණ හමුවන්න.
සංහිත ප්‍රතිකාර මධ්‍යස්ථානය
නො.133 සණස වෙළඳ සංකීර්ණය නුවර පාර, යක්කල, ගම්පහ.
(යක්කල කාගිල්ස් ෆුඩ්සිටි 4 වන මහල)
දිනපතා පෙ.ව 9.00 සිට ප.ව 4.30
පෝය සහ සිකුරාදා දින නිවාඩු
අනු ශාඛා නොමැත W.P.11015

හද ගැස්ම මංගල සේවය
ඔබ තවමත් තනිකඩද? ඔබ, පසුතැවිල්ලෙන්ද?
වැඩි වයස්, වැන්දඹු, දික්කසාද මේ කුමන තරාතිරමක වුවද ඔබට ගැලපෙන සහකරු හෝ සහකාරිය අපගේ දහස් ගණනක් යෝජනා අතරින් පැයක් ඇතුළත අප සොයා දෙන්නම්.
ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට ඔබ බලාපොරොත්තු වනම ආකාරයේ හොඳම යෝජනා ඡායාරූප ද සහිතව පැයක් ඇතුළත එවීම සිදු කෙරේ.
ලියාපදිංචිවීමට හා විස්තර දැනගැනීමට 076 2200 533 ට දැන්ම මිස් කෝල් එකක් දෙන්න.
S&N ad
ප්‍රධාන කාර්යාලය : පොලීසිය අසල, නිට්ටඹුව
ලියාපදිංචිය නොමිලේ...
076-2200533
ශ්‍රී ලංකාවේ වැඩිම යෝජනා ප්‍රමාණය (යෝජනා 38000 ක්) අප ආයතනය සතුය.


කාන්තාවන්ගේ
LONDON ANTIAGING MEDICAL CLINIC
අභිමීචූ පිරිසිදුභාවය ඔබට ගැටලුවක්ද?
● රහස්‍යභාවය සුරක්ෂිතයි.
● වෛද්‍යවරයා වෑනල් කිරීම සඳහා ගාස්තු අය නොකෙරේ.
www.londonantiaging.lk
116/11, තිඹිරිගස්යාය පාර, කොළඹ 05.
https://www.facebook.com/londonantiaging.lk
Reg No.PHSRC/MC/308
☎ 0114 943 999 / 0718 689 531

ජයදද JAYADADA MANAGALA SEWAYA
මංගල සේවය
ඔබ, ඔබගේ දුව හෝ පුතා විවාහ අපේක්ෂිතද ?
අප ආයතනයේ ලියාපදිංචි වී ඇති මංගල යෝජනා
10,000 ක් අතරින් තෝරා ගන්න.
නොමිලේ ලියාපදිංචි වෙන්න.
යෝජිතයාගේ තොරතුරු හා උපන් වෙලාව පවසා නොමිලේ ලියාපදිංචි වීමට
077 89 99 322 අංකයට
මිස් කෝල් එකක් දෙන්න.
ඔබට ගැලපෙන යෝජනා තැපෑලෙන් එවනු ලැබේ.
අප එවන යෝජනා වලට ඔබ කැමති නම්, මුදල් ගෙවන්න.
විවාහයක් වෙනතුරුම ලියාපදිංචිය වලංගුය.
071 9119454, 070 5252984, 070 6600610
ජයදද ආයතනය
අංක 62/4C, සීලරතන මාවත, හොරණ.
(ආයතනය ඉරිදා වසා ඇත.)

සැත්කම් අනවශ්‍යයි.
සැත්කමින් සුව කළ යුතු සෞඛ්‍ය තත්ත්වයන්
බාහිර ආලේපයෙන් සුවපත් කරන අති ප්‍රබල ශාකසාර සුසංයෝගය
රාවණා කෝප්වර්ස් බාම්
RAWANA COPWARS BALM
▪ අර්ශස්
▪ ගල්තැලුම්
▪ ඉන්නන්
▪ විසප්පු
▪ ගෙඩි, මස්දළු
▪ නහර ගැට ගැසීම
වැනි තත්ත්වයන් සඳහා සාර්ථක සහනය සලසයි.
RAWANA COPWARS BALM කෝප්වර්ස් බාම්
15g මිල රු.250/=
ඔසුසල් හා ෆාමසි වලින්
077 588 544 6
බෙදාහැරීම් නියෝජිත - V.A.S.T.K.S. නාඩාර් සහ පුත්‍රයෝ, නො 41, වේල්ලවීදිය, කොළඹ 12.
නිෂ්පාදනය - සි.ස. රාවණා ලංකා හර්බල්ස් පුද්. සමාගම, වැලිවත්ත, බලගොඩ, පෝද්දල.

# ‘ස්නේහා’ ආත්මාර්ථකාමියි ‘පාරමී’ අහිංසකයි

**“හීනයකි මේ ආදරේ” මේ දිනවල ඉතා ඉහළ ප්‍රේක්ෂක ප්‍රතිචාර සමඟ විකාශය වන ටෙලි නිර්මාණයක්. ඒ තුළින් පුංචි තිරයට එකතු වුණු අලුත්ම පෙම් යුවළ තමයි කලා ක්ෂේත්‍රයේ වැඩිම ආදරයක් ප්‍රතිචාරයක් ලබන කලා තරු දෙකක් වන ශලනි තාරකා සහ අකිල ධනුද්දර මෙවර සඳැල්ල කවරයද හැඩ කරමින් අප සමඟ කතාබහක නිරත වුණේ ඒ දෙපළයි.**





**• මේ දිනවල “හීනයකි මේ ආදරේ” සහ “කියා දෙන්න ආදරේ තරම්” එක්ක පුංචි තිරයට ආදරේ අරන් එන ශලනි තාරකාට ප්‍රේක්ෂකයො ඇයි මෙතරම් ආදරේ?**

ඇත්තටම ඒකට හේතුවක් කියන්න නම් මම දන්නෙ නැහැ. නමුත් මම ක්ෂේත්‍රයට ආපු දා පටන්ම මට ආදරය කරන ප්‍රේක්ෂක පිරිසක් ඉන්නවා. මම රංගනයෙන් දායක වන හැම නිර්මාණයක් එක්කම එකතුවෙලා ඉන්නවා ඒ පිරිස. ඉතින් මම අහිංසක චරිතයක් නිරූපණය කළත්, දුෂ්ට චරිතයක් නිරූපණය කළත් ඒ ආදරය සදා නොවෙනස්ව තියෙනවා. ඒ ගැන ඇත්තටම මට සතුටුයි.



**• මේ දිනවල ශලනිට ප්‍රතිචාර ලැබෙන්නෙ කියාදෙන්න ආදරේ තරම්හි “ස්නේහා” ටත් හීනයකි මේ ආදරේ නිර්මාණයේ “පාරමී” ටත් ඉතින් මෙ චරිත දෙකත් අහිංසක සහ දුෂ්ට විදියට නේද ගලාගෙන යන්නෙ?**

ඔව්, කියාදෙන්න ආදරේ තරම්හි ස්නේහා කියන්නෙ හරි ආත්මාර්තකමී චරිතයක්. ස්නේහාට බැනපු පිරිසකුත් හිටියා. ඇත්තටම ඒ චරිතය බලද්දී මටත් හිතෙන්නෙ ඇයට බනින්න තමයි. මොකද ස්නේහා චරිතය බැනුම් ඇසිය යුතු චරිතයක්නෙ. මානසික මට්ටම එක තැනක නැති තරුණියක් ඇය. එවැනි චරිත අපි ඇත්ත ජීවිතේත් ඕනෑ තරම් දැකලා තියෙනවා. එහෙම යාළුවොත් මට ඉඳලා තියෙනවා. අධික ලෙස ආදරය කිරීමත් ලොකු විනාශයක්නෙ. ඉතින් ස්නේහාගේ ආදරය ඇයටම දරාගන්න බැහැ. ඉතින් මේ නිර්මාණය එක්ක මම එකතුවෙලා දැන් අවුරුදු එක හමාරකට වඩා වැඩියි. කොටස් 400 කට ආසන්න සංඛ්‍යාවක් මේ වෙද්දී විකාශය වෙලා තියෙනවා. ඒ කාලසීමාව ඇතුළත ස්නේහා චරිතය විවිධ පැතිවලට පෙරළුණා. ආරම්භයේ හිටපු ඇය නෙමෙයි කොටස් 100 විකාශය වෙද්දී. එතැනින් පසුව අද වනතුරු කාලෙන් කාලෙට වෙනස් වුණා. ඒකාකාරී නොවී චරිතය ගලාගෙන ගියේ. ඒ තුළ අහිංසකකම, දුෂ්ටකම හැම පැත්තක්ම තිබුණා. ඉදිරියේදී මේ චරිත තුළ ලොකු වෙනසක් වෙන්නත් නියමිතයි. ඉතින් විවිධ පැතිවලට ගිය මේ චරිතයට මෙගා ටෙලි නිර්මාණයක් තුළ මට කරන්න පුළුවන් සීමාවන් තුළ උපරිම සාධාරණයක් කළා කියලා හිතෙනවා. ඒක නිසා තමයි ප්‍රේක්ෂකයන් අතරට මේ චරිතය මෙතරම් ගියේ සහ කාලයෙන් කාලයට වෙනස් විදියෙ ප්‍රතිචාර ලැබුණෙ. ඒ අතරතුර බැනුම් අහන්නත් වුණේ. එතකොට ‘‘හීනයකි මේ ආදරේ’’ හි ‘‘පාරමී’’ ගැන කතා කළොත් ඇය තවම ප්‍රේක්ෂකයන්ට අලුත්නෙ. ඉතින් පාරමී ගැන කීවොත් ඇය හරිම නිවුණු අහිංසක ගැහැණු ළමයෙක්. පාරමී ස්නේහාට වඩා හාත්පසින්ම වෙනස් චරිතයක්. නමුත් එකම පවුල් පසුබිමක්. පවුල් පසුබිම් සමාන වුණාට සිතුම්, පැතුම් හැසිරීම් රටාව අහසයි පොළොවයි වගේ. ‘‘හීනයකි මේ ආදරේ’’ විකාශය ආරම්භ වෙලා තවම සීමිත දින ගණනක්නෙ. ඒ නිසා මේ නිර්මාණය ගැන මම ගොඩක් කතා කරන්නෙ නැහැ. කතා කළොත් ඉදිරියට කුතුහලය නැතිවෙයි කියලා හිතනවා. ඒ නිසා ප්‍රේක්ෂකයන්ටම තමයි පාරමීවත් භාර කරන්න ඕනා. පාරමී චරිතයත් ස්නේහා වගේම වෙනස් විදියට ප්‍රේක්ෂක හදවත්වලට යයි කියලා හිතනවා.

## අකිල එක්ක කරන පළමු රංගනය

**• “හීනයකි මේ ආදරේ” තුළ ශලනිට වැඩි රංගනයක් කරන්න තියෙන්නෙ අකිලත් එක්ක. ඒ රංගනය කොහොමද?**

අකිල එක්ක මම පළමු වතාවට වැඩ කරන්නෙ. මීට පෙර අපිට එක නිර්මාණයක වැඩ කරන්න අවස්ථාව ලැබිලා නැහැ. මේ නිර්මාණයෙත් තවම මුල් කොටස් කිහිපය තමයි වැඩ කරන්න ලැබුණෙ. තවම සීමිත කාල සීමාවක්. ඒ කාලය තුළ අපි ඉතින් ඉතා සුහදව වැඩ කළා. ඉදිරියෙදි ඉතින් අපේ ඒ රංගනයන් දැකබලා ගන්න හැකිවෙයි.

**• ශලනිට ආදරේ කරන බොහෝ දෙනෙක් කියන කතාවක් තමයි ගැමි, නාගරික හෝ ඕනෑම චරිතයකට සාධාරණයක් කරන රංගන ශිල්පිනියන්ගෙන් අද වන විට ඉදිරියෙන්ම ඉන්නෙ ඔබ කියලා? ඒ නිසාම වෙන්න ඇති එකම වේදිකාවක හොඳම නිළිය සහ ජනප්‍රියම නිළිය සම්මානයන්ටත් පාත්‍ර වුණේ? ඒ ගැන මොකක්ද කියන්න තියෙන්නෙ?**

ඒ ගැන ඇත්තටම සතුටුයි. මට පසුගිය කාලෙ එකිනෙකට වෙනස් විවිධාකාර විදියෙ චරිත ගොන්නක් එක දිගට ලැබුණා. ඒක මගෙ වාසනාවක්. ඒ වගේම ඒ නිර්මාණවල අධ්‍යක්ෂවරු මගෙ ගැන තබපු විශ්වාසයටත් ඔවුන්ට ස්තූතිවන්ත වෙන්න ඕනෑ. අධ්‍යක්ෂවරු මාව විශ්වාස කරලා ඒ චරිත දුන්නම අදාල පිටපත කියවලා දර්ශන තලයට යද්දී මොකක් හෝ හේතුවකට මට ඒ ඒ චරිතවලට ප්‍රවිශ්ට වෙන්න ඒ ස්ථානයේදී හැකියාවක් ලැබෙනවා. ඒ කොහෙන් හෝ ලැබෙන හැකියාවට මම ස්තූතිවන්ත වෙන්න ඕනෑ. මම හිතන්නෙ මට කලා ජීවිතේ මම මෙතෙක් ලැබූ අත්දැකීම් ඒ චරිත රංගනවලට ඉවහල් වෙනවා ඇති. මොකද මට රංගන ක්ෂේත්‍රයට ආපු මුල් කාලයේදී ලැබුණෙ මල් මල් චරිත බොළඳ චරිත රංගනයන්. ඒ මගේ පෙනුම සහ වයසත් එක්ක වෙන්න ඇති. ඒ කාල සීමාවෙ ලැබුණෙම ඒකාකාරී පෙම්වතියගේ චරිතය. මට අවුරුදු 23, 24 වෙද්දී තමයි වෙනස් විදියෙ චරිත රංගනයන් ලැබුණෙ. මුලින්ම හොඳම නිළියට නිර්දේශ වුණේ ආනන්ද අබේනායක අධ්‍යක්ෂවරයාගේ ටෙලි නිර්මාණයකින්. එතැනින් පසුව ටිකින් ටික යම් යම් චරිත ලැබුණා. මෑත කාලයේදී තමයි එකිනෙකට වෙනස් චරිතයන් ලැබුණෙ.

**• ශලනි අද ඇවිල්ලා තියෙන ගමන ගැන මොකද හිතෙන්නෙ? කලා තරුවක් වීමේ අරමුණක් තිබුණද?**

ඇත්තටම නැහැ. නමුත් ගොඩක් සතුටුයි අද ඉන්න තැන ගැන. ඇත්තටම මේ මම බලාපොරොත්තු වුණු ගමනක් නෙමෙයි, මේ ගමන අහම්බයක්. නමුත් මගේ ආගම දහමට, දෛවයට ඒ හැමදේටම අනුව මේ මට ලැබුණු මාර්ගය වෙන්න ඇති. මගේ පුංචි කාලෙනම් මට රංගන ශිල්පිනියක් වෙන්න කැමැත්තක් තිබුණා. ඒ අවුරුදු 5 ක් 6 ක් වගේ පොඩි වයසකදි. ඒ කාලෙදි මට පොඩි හින්දි පිස්සුවක් එහෙම තිබුණා. නමුත් ඒ කාලෙදි හරිම ලැජ්ජාශීලී ළමයෙක්. ඒකත් එක්ක රඟපාන්න නම් කිසිම දෙයක් ඔළුවෙ තිබුණෙ නැහැ. ඒ වගේම විශ්වවිද්‍යාලයට යන්න ඕනෑ. වෛද්‍යවරයෙක් ඉංජිනේරුවරියක් ඒ වගේ වෙන්න හීන තිබුණොත් නැහැ. මට ඕනෑ වුණේ ව්‍යාපාරයක් කරන්න. නිදහසේ රැකියාවක් කරගෙන යන්න. පාසල් කාලේ මම ඉගෙන ගන්නත් දක්ෂයි. වැඩිපුරම ලකුණු තිබුණෙ ගණිත විෂයට. ඒත් කිසිම විදියකින් විශ්වවිද්‍යාලයට යන්න ඕනෑ කියලා හිතපු කෙනෙක් නෙමෙයි මම. විශ්වවිද්‍යාලයට යාම සමහරුන්ගෙ හීනයක්නෙ. ඉතින් මට ඒ හීන තිබුණෙ නැහැ. ඒ වගේම රංගනයට සම්බන්ධ වෙන්නත් හිතකවත් තිබුණෙ නැහැ. අඩුම තරමෙ සිරස කුමරිය තරඟය ජයග්‍රහණය කළාට පසුවවත් රංගනයට සම්බන්ධ වුණේ නැහැ. ලැබුණු ආරාධනා පවා ප්‍රතික්ෂේප කළා. තරගාවලියෙන් මාස 8 කට පසුව තමයි රංගනයට පිවිසෙන්නෙ. ඒ පළමු රංගනය කරලත් මට මේ දේ හරියන්නෙ නැහැ කියලා හැරිලා ගෙදර යනවා. ඊට වසරකට පසුව තමයි නැවතත් ලැබුණු ආරාධනාවක් එක්ක කලා ක්ෂේත්‍රයට එකතු වෙන්නෙ. ඉතින් ඒ විදියට බැහැ කිය කිය ඉඳලා අවසානයේ කලාව මගේ ජීවිතේ වුණා. ඉතින් මේ මගේ ලැබීම වෙන්න ඇති. ඒ ලැබීම ගැන මම අද සතුටින්.

**• සිරස කුමාරිය තරගාවලියේ ජයග්‍රහණය තුළින් ක්ෂේත්‍රයට ආපු ශලනිට එදා වගේම අදටත් ඒ ආදරය නොඅඩුව ලැබිලා තියෙනවා. ඒ ගැන මොකද හිතෙන්නෙ?**

නිහතමානී සතුටක් තියෙනවා. සිරස කුමරිය තරගය පවත්වලා අවුරුදු 15 ක් වගේ කාලයක් වෙනවා මේ වෙද්දී. ඉතින් ඒ කාලයේ පටන් අද වනතුරුම ඒ ආදරය, ප්‍රතිචාරවල කිසිදු අඩුවක් නැහැ. ඒ හැමදේම මට ලොකු ආශිර්වාදයක්. ප්‍රේක්ෂක ආදරය ප්‍රතිචාර නිසා තමයි කලාකරුවන් ඒ ක්ෂේත්‍රය තුළ රැඳිලා ඉන්නේ. මට ඒ වාසනාව එදා සිට අද දක්වාම තියෙනවා. ඒ දේවල් නිසා තමයි අපි මේ ක්ෂේත්‍රය තුළ ගමනක් යන්නෙ. ඒ ආදරයට මමත් හැමදාමත් ගොඩක් ආදරෙයි. විශේෂයෙන්ම කියන්න ඕනෑ U Tube හරහා ආදරණීය ප්‍රේක්ෂකයො දක්වන ප්‍රතිචාර මම බලනවා. ඒ ප්‍රතිචාර ඇත්තටම ඉදිරි ගමනට ශක්තියක්. ඒවා මට ගොඩක් වටිනවා.



**ශලනි තාරකා**

ධනු විජේරත්න

සජීව ලක්ෂාන්

# ‘පවන්’ මං වගේ චරිතයක්

**• “හීනයකි මේ ආදරේ” අකිලගේ අලුත්ම ටෙලි රංගනය? ටෙලි නිර්මාණයකට සම්බන්ධ වුණේ ටික කාලයකට පසුව නේද?**

මම ටෙලි නිර්මාණවලට සම්බන්ධ වෙන්නෙ නම් ඉතා අඩුවෙන්. ඒ වෙනුවෙන් සම්බන්ධ වෙන්න නම් හොඳම ආරාධනාවක් වෙන්න ඕනෑ. මීට පෙර ටෙලි නිර්මාණ කිහිපයක් කරලා තියෙනවා. නමුත් ඒ කොටස් 50, 60නිර්මාණ. ඒවත් එක්ක දීර්ඝ කතාවකට සම්බන්ධ වුණේ ‘‘සක්කාරං’’ නිර්මාණය වෙනුවෙන්. එතැනින් පසුව තමයි දීර්ඝ නාට්‍යයක් විදියට ‘‘හීනයකි මේ ආදරේ’’ එක්ක එකතු වෙන්නෙ.

**• හොඳම ආරාධනාවක් ලැබුණොත්නෙ සම්බන්ධ වෙනවා කිව්වෙ? මේ ලැබුණෙ හොඳම ආරාධනාවක්ද?**

අනිවාර්යයෙන්ම මම මේ නිර්මාණය වෙනුවෙන් ආරාධනා කළාම එකවරම කැමති වුණා. හේතුව මම ශාන්ත සොයිසා අධ්‍යක්ෂවරයාගේ වැඩකට සම්බන්ධ වෙන්න කැමැත්තකින් හිටියෙ. පබා, පබළු වගේ ඔහුගේ නිර්මාණවලට මම ගොඩක් කැමැතියි. අපි එතකොට ටිකක් පොඩියි. ඒ කාලෙ ඒවා ලොකු ආසාවකින් නැරඹුවේ. අපේ අම්මත් ඒ නිර්මාණවලට සම්බන්ධ වෙලා හිටියා. ඉතින් ඒ කාලෙ ඉන්දියානු කතා රැල්ල කඩන්න ආපු නාට්‍යයනෙ ඒ, අපිත් ආසාවෙන් බැලුවෙ. ඒවත් එක්ක මහේෂ් රත්සර මද්දුමආරච්චි මහත්මයගෙ පිටපත් රචනයකට වැඩ කිරීමේ කැමැත්තකුත් මගේ හිතේ තිබුණා. ඒ නිසා මේ අවස්ථාව ලැබුණු ගමන් මේ දේට මම කැමති වුණා.

**• අකිල වැඩිපුර සම්බන්ධ වෙලා තියෙන්නෙ ඉතිහාස කතාවලට නේද? ඒ චරිත රංගන එක්ක බලද්දී “පවන්” කියන්නෙ වෙනසක් ඇති කරපු චරිතයක් නේද?**









## අප්පච්චි චිත්‍රපට වල වගේම ඇත්ත ජීවිතෙත් වීරයෙක්

ඔව්. මට වැඩිපුර ලැබිලා තියෙන්නෙ ඉතිහාස චරිත සහ ගැමි චරිත. මට මේ නිර්මාණයට ආරාධනා ලැබෙන්නට පෙර ශාන්ත සොයිසා මහත්මයා මුලින්ම කතා කළේ වෙනත් නිර්මාණයකට. ඒ ඉතිහාසයේ සිට වර්තමානය දක්වා ගලාගෙන යන රාජ්‍ය සම්මාන දිනූ නව කතාවක් වන ‘‘කාල නදිය ගලා බසී’’ පොත නිර්මාණයක් විදියට කරන්න බලාගෙන ඒ වෙනුවෙන් මට කතා කළේ. ඒ වෙනුවෙන් මම කැමැත්ත ප්‍රකාශ කරලා තිබුණා. නමුත් ඒ නිර්මාණය ටික කාලයකට කල් දැම්මා. ඉතින් අනතුරුව තමයි මේ නිර්මාණයට කතා කළේ. ඉතින් මම දෙවරක් නොසිතා කැමැත්ත ප්‍රකාශ කළා. ඒ ගත්තු තීරණය ගැන ලොකු සතුටක් තියෙනවා.

**• ඉතින් මේ “පවන්” ගැන කතා කරමු?**

‘‘පවන්’’ කියන නම මගෙ ජීවිතේට ගොඩක් ළඟයි. හේතුව මම කලාව කියන දේ ආරම්භ කරන්නෙම ඒ නමින්. මගේ ඒ ආරම්භය සිදුවෙන්නෙ රොමේෂ් සුගතපාලගේ ‘‘දිගු දෑස දුටුවාම’’ මියුසික් වීඩියෝවෙන්. ඒ කාලයේ මේ මියුසික් වීඩියෝව ඉතා ජනප්‍රිය වුණා. වීව්ස් ගොඩක් හැදුණා. ඒවා Face book තුළ වැඩි වශයෙන් දකින්න තිබුණා. ඉතින් ඒ මියුසික් වීඩියෝව තුළත්

## අකිල ධනුද්දර

මගේ නම ‘‘පවන්’’ නෙ. ඒ නිසාම මේ නිර්මාණයේත් මගේ නම ‘‘පවන්’’ කියද්දී ඒ ගැනත් සතුටක් තමයි දැනුනෙ. පවන් ගෙදරට එක් චරිතයක්, යාළුවොත් එක්ක වෙනම චරිතයක් වගේම පෙම්වතිය ළඟ වෙනම කෙනෙක්. ඒ එක් එක් විදියට හැසිරෙන මේ චරිතය වුණු පවන්. මම වගේ කියලා හිතෙන තරමට මගේ ජීවිතේට ළඟයි. ඒ නිසා මේ තුළ මම ජීවත් වෙනවා හරි ආසාවෙන්. මට මේ තුළ රඟපාන්න දෙයක් නැද්ද කියලත් හිතෙන තරමට ජීවිතේට ළඟ බවක් තියෙනවා. මේ තුළ මගේ ඇත්ත ජීවිතේ ගුණාංග ගොඩක් තියෙනවා. ඒ නිසා මට ඒ චරිතය ඉක්මනින් ළං කරගන්න හැකි වුණා.

**• අකිලගෙ මේ නිර්මාණය බිරිඳ සහ දියණිය නරඹනවද?**

ඔව් දෙන්නම බලනවා. බබා ඒවා බලාගෙන ඉඳලා අහනවා අප්පච්චි කවුදමේ ඇන්ටි කියලා. මේ අම්මා නේද? එහෙම කියලා අහනවා. මේ කතාව යද්දී පළවෙනි දවස්වල පොඩි ඊර්ශ්‍යාවක් වගේ තිබුණා. නමුත් බබා දන්නවා මේ ලෝකේ රඟපානවා කියලා දෙයක් තියෙනවා කියලා. අපි සමහර වෙලාවට වැඩවටල එහෙම යද්දී අරගෙනනෙ යන්නෙ. ඒ නිසා ඒ දේවල් බබාට පුරුදුයි.

**• බිරිඳට ඊර්ෂ්‍යාවක් එහෙම හිතෙන්නෙ නැද්ද නිර්මාණ තුළ අකිලගෙ පෙම් ජවනිකා දකිද්දී?**

මම විවාහ වුණේ මගේ Secretary සමග. ඒ නිසා මගෙත් එක්ක වැඩ කරන සියලුම දෙනා බිරිඳගෙත් යාළුවො. ඇය කොහොමත් මගේ රැකියාව තේරුම් අරගෙන ඉන්නෙ. ඒ කාලෙනම් පොඩි පොඩි ඊර්ෂ්‍යාවන් තිබුණා. නමුත් ඇය අදටත් මගෙත් එක්ක මම යන හැම තැනකම යන එන නිසා ඒ යන තැන්වලින් ඇයට ලැබෙන පිළිගැනීම ඒ හැමත් එක්කම දැන් කිසි ප්‍රශ්නයක් නැහැ.

**• මේ තුළ අකිලට රංගනයෙන් දායක වෙන්න තියෙන්නෙ ප්‍රේක්ෂක ආදාරය ප්‍රතිචාර බෙහෙවින් දිනාගත් සම්මානනීය රංගන ශිල්පිනියක් වන ශලනි තාරකා එක්ක. ඇය සමඟ රංගනය කොහොමද?**

මුලින්ම කියන්න ඕනෑ මම ශලනිත් එක්ක වැඩ කරන්න කැමැත්තෙන් හිටපු කෙනෙක්. ඇය මගේම වයසෙ වුණාත් කලා ක්ෂේත්‍රයට සම්බන්ධ වෙන්නෙ මීට අවුරුදු 15 කට පෙර වගේනෙ. ඇත්තටම මම මේ ක්ෂේත්‍රයට සම්බන්ධ වෙන්නෙ නැහැම කියලා හිතපු කාලයක් තිබුණානෙ. ඒ කාලෙදි මම රූපවාහිනිය නරඹද්දි ශලනිව මුලින්ම දකින්නෙ කුමරියක් විදියට. ඇයව කුමරියක් කරන්න මම ඒ කාලෙදි SMS පවා යවලා තියෙනවා. ඉතින් අදටත් මම ඇයට කතා කරන්නෙ කුමරිය කියලා. ඇත්තටම ඇය එක්ක වැඩ කරද්දි තේරෙන දේ තමයි ඇයගේ වෘත්තියභාවය කියන කෑල්ල ඉතා විශාලයි. ඒ නිසා ඇයත් එක්ක වැඩ කරන්න ඉතා ලේසියි.

**• මීට අමතරව කරන රංගනයන් ගැනත් කියමුද?**

මේ දිනවල තවත් නාට්‍යයක වැඩ කටයුතු කරගෙන යනවා. ඒ අපේම රංගන ශිල්පියකු වන ධනංජය සිරිවර්ධන අධ්‍යක්ෂණය කරන වෙනස්ම නිර්මාණයක. ‘‘සිදුදියේ මනාලියෝ’’ කියන නිර්මාණය. ඒ තුළ ලස්සන කතාවක් තියෙනවා. ගමේ සිට නගරයට ආපු ගැහැණු ළමයි පිරිසකගේ කතාවක්. ඒ තුළ රහස් පරීක්ෂක කතාවකුත් ගලාගෙන යනවා. ඒ වගේම සිනමා නිර්මාණ කිහිපයක වැඩ කටයුතුත් ඉදිරියේදී දැකගන්න ලැබෙයි. ඊට අමතරව ලබන වසරේ හිරු නාළිකාවෙ රියැලටි වැඩසටහනක විනිශ්චය මණ්ඩලයේ වාඩිවෙන්න නියමිතව තියෙනවා.

**• රටම ආදරය කරන ඔබේ පියාණන්ගේ තත්ත්වය ගැනත් සඳහනක් කරමු?**

ඇත්තටම අද අපි එළියට බැස්සත් අපේ කලා නිර්මාණ ගැන කතා කරනවා වෙනුවට අප්පච්චි ගැන තමයි හැමදෙනාම කතා කරන්නෙ. බොහෝ දෙනෙක් ඉක්මන් සුව ප්‍රාර්ථනා කරලා බෝධි පූජා, ආශිර්වාද පූජා පවත්වනවා. ඇත්තටම ඒ ආදරේ ලොකු ශක්තියක්. ඉතින් මේ සිදුවුණේ උනක්, සෙම්ප්‍රතිශ්‍යාවක් වගේ සතියෙන් දෙකෙන් සුවවෙන රෝගයක් නෙමෙයි. දරුණු අනතුරක් තමයි සිදුවුණේ. ඒ නිසා මෙය එක පැත්තකින් ලොකු යුද්ධයක්. ඉතින් චිත්‍රපටවලට අප්පච්චි වීරයා වුණා වගේම ඇත්ත ජීවිතෙත් වීර මනුෂ්‍යයෙක්. ඉතින් ඉක්මණට නැවතත් අප්පච්චි අපි ළඟට එනවා.

ධනු විජේරත්න
සජීව ලක්ෂාන්

TRAVEL



# හන්තාන අඩවියේ...

**සමනොල කන්ද ළඟට වැඩියෙන්ම නම කියැවෙන ලංකාවේ කන්දක් වේනම් ඒ හන්තානයි. කවි ගීතවලට මෙන්ම නවකතා බහුතරයකදීද කියැවෙන හන්තාන සාහිත්‍ය ලෝකයේ අමරණීය ස්ථානයක් බවට පත්ව ඇති නිසාය.**

පේරාදෙණිය සරසවිය හා සම්බන්ධ වුණු ගීත ගැයුණු ප්‍රසංගයක් මීට වසර කිහිපයකට කලින් පැවැත්විණි. එදා ගැයුණු හැම ගීතයකටම හන්තාන සම්බන්ධ වී තිබිණි. එසේම පේරාදෙණිය සරසවිය පසුබිම් වූ නවකතාවලද හන්තාන ගැන කියැවෙන්නේමය. ඒ හැම සරසවි පෙම් යුවලකම නොවැරැදීම හන්තාන කන්ද තරණය කළෝය. සීත මීදුම් රොටුවක් පැමිණ ඔවුන් වැසී යනවිට අපූරු චමත්කාරයක් වින්දහ. විවිධ සංවිධාන පිහිටුවා ගෙන හන්තාන පිරිසුදු කළහ. අකල් ගිනි ඇවිලෙද්දී ඒ ගිනි නිවාගන්නට රැක ගන්නට කැප වූහ.

ඇත්ත වශයෙන්ම පැවසුවහොත් හන්තාන අඩවිය පේරාදෙණි සරසවි පෙම්වතුන් සතු අපූරුතම ප්‍රේමණීය සැමරුමකි.

වෙන එකක් එපා ! හන්තානට පායන සඳ පවා පේරාදෙණිය සරසවි ප්‍රේමයේ සදාකාලික සංකේතයකි.


එසේ වීමට ප්‍රධානතම හේතුවක් වී ඇත්තේ පේරාදෙණි සරසවි බිම දිගේ හන්තාන අඩවියට පිවිසිය හැකි ප්‍රවේශ මාර්ගයක් තිබීමය. මේ නිසාම සරසවි පෙම්වතුන්ට හන්තාන අඩවියේ සැරිසැරීමට පුළුවන.



පේරාදෙණියේ සිට මහනුවර නගරය දක්වාම විහිදුණු හන්තාන කඳු වැටියට තවත් ප්‍රවේශයක් මහනුවර රෝහල අසලින්ද වේ.

මේ මොන ප්‍රවේශ දොරටුවෙන් ගියත් හන්තාන අඩවියේදී දකින්නට ලැබෙන්නේ සොබාදහමේ සුන්දරම දර්ශනයකි.

හන්තාන කඳු වැටිය වූ කලී කඳු හිස් හතකින් සැදුම් ලද්දකි. එහි එක් කඳු මුදුනක් වන්නේ ඌරාගලය. අවසන් කඳුමුදුන වන්නේ කටුසු කොන්දය. කටුස්සකුගේ පිට කොන්දේ හැඩය ගත් අතිදුෂ්කර නැගීමක් සහිත කටුසු කොන්දට නගින්නේ එහෙමත් කෙනෙකි.



එමනිසා හන්තාන කඳුවැටියේ කඳු හිස් හතම තරණය කරන්නේ නම් පළමුව ඌරකු විය යුතුය. අන්තිමේ කටුස්සකු විය යුතුය. කෙසේ වෙතත් කටුසු කොන්ද කන්ද නගින්නට කටුස්සකුගේ වෙස් ගත්තත් අසීරුය. මේ නිසා හන්තාන අඩවියට පිවිසෙන බොහෝ දෙනෙක් ඌරාකන්දේ නවතී. හන්තානේ අසිරිය නෙත් පුරා දැකගන්නට ඌරාකන්දට යෑම පමණක් වුව ප්‍රමාණවත්ය. එතැනට පෙනෙන්නේ සොබාදහමේ අසිරිමත්ම දර්ශනයකි



වික්ටෝරියා ජලාශයේ නිල්පාටද බතලගල, කඩුගන්නාව වැනි අවට කඳු මුදුන්වල කොළ පාටද හන්තාන කඳු හිසේ සිට නෙත්පුරා දැකබලාගත හැකිය.

මෙන්න මේ හන්තාන කඳුවැටියට තවත් වටිනාකමක් දෙන්නට ඉදිවී, ඇති හන්තාන එකෝ ලොජ්' නැමැති පාරසරික සංචාරක නවාතැන ද දෙස් විදෙස් සංචාරකයන්ගේ ආදරයට පාත්‍රව ඇත. එම භූමි භාගය අවට පවතින්නේද සොබාදහමේ සුන්දරම දේවල්ය. කඩාහැලෙන කුඩා දිය ඇල්ලක් පේන මානයේ ඉදිව ඇති මේ සොඳුරු නවාතැන විලා කිහිපයක එකතුවකි. සොබා සොඳුරු පරිසරයට උචිත අන්දමට බාහිර පෙනුමක් ඇතිව ඉදිකර තිබුණත් ඒ විලාවල අභ්‍යන්තරයේ නම් සියලු සැප පහසු කම් ඇත්තේය.



කෙසේ වෙතත් මෙහි ලැගුම් ගන්නෙකුට වැදගත් වන්නේ විලා අභ්‍යන්තරයෙහි ඇති සුඛෝපභෝගීත්වය හෝ සැපපහසුව හෝ නොවේ. අවට පරිසරය පුරා විසිරුණු සොබාදහමේ අපූර්වත්වයයි. පවනේ වෙලී ගී ගයන තුරු ලතා මෙන්ම ඊටත් වඩා මිහිරිව ගී ගයන කුරුල්ලන්ගේ හඬයි.

ඒ එක්කම දුර බැහැරින් පෙනෙන නිල්ල වැහුණු කඳු යායේ අසිරියයි. එක්වරම නිල්ල වසාගෙන පාව යන සුදුම සුදු මීදුම් රොටුවේ දසුනයි. ඒ සමාගම ගත දැවටෙන සිහිල් සිනිඳු සීතලයි.

මෙම විලාවක ලැගුම් ගන්නෙකුට ගිටාරයක් වයමින් ගයන්නටද බොහෝ ගී තිබේ. ඒ සියල්ලම හන්තාන ගැන පබැදුනු ගීතය. එකක් ඉවර වෙනකොට තවත් එකක් ගයන්නට තරම් හන්තාන ගී ඕනතරම් මතකයට නැගේ.

ඒ ගීතාවලියේ අවසානම ගීතය හන්තානට පායන සඳ ලස්සනයිද බලන්න යන්නය. ඇත්තටම මෙම විලාවට ආ කෙනෙකුට හන්තානට පායන සඳේ ලස්සන සිත්පුරා නෙත්පුරා විඳගත හැකිය.

විටෙක මීදුමට වැසී යන සඳ තවත් විටෙක හිනාවීගෙන අප දෙස බලා සිටී. සීතලම සීතලේ දෑතද පොරවාගෙන ඈත අහසේ ඉඟිමරන සඳ දෙස බලන්නට සුදුසුම තැන මේ විලා බිම බව ඔබ, හිතවත් ලෙංගතු හැමෝටම පවසනු ඇත.




ඒ සුන්දර රාත්‍රිය අවසන හිරු අවදිවෙද්දී හතර අතින් ඇසෙන්නේ කුරුලු ගී සංධ්වනියයි. හැම කුරුල්ලෙකුම අලුත් දවස පිළිගන්නේ සුවහසක් ගීත ගයමින් වන බැවිනි. රැයේ ගැයූ ගී වලටත් වඩා මේ කුරුලු ගී මිහිරිදැයි දෙගිඩියාවක් පවා හිතේ උපදිනු නියතය.

ශාන්ත කුමාර විතාන
'හන්තාන එකෝ ලොජ්'

ඉස්සර බොරළු පාර
ගාලු පාර ගාලු පාර
සුද්ද තාර දපු
ගාලු පාර ගාලු පාර
අද අපි කවුරුත් යන්නේ
අද අපි කවුරුත් යන්නේ
පාරේ ගාලු පාරේ
පාරේ ගාලු පාරේ

# ගාලු පාරේ ජිප්සීස්





**ජිප්සීස් කියන්නේ කලින් කලට හරි අමුතු විදියෙ, වෙනස් නිර්මාණ සංගීත ලෝකයට දායාද කළ කණ්ඩායමක්. වසරේ තුන්සිය හැටපස් දවසේම වගේ කාර්යබහුල ජිප්සීල්ලා ගැන අද විශේෂයෙන් කතා වන්නේ 'ගාලු පාරේ' ගීතය නිසයි. මේ ගීතය ජිප්සීස් සුනිල් පෙරේරා හෙවත් ආදරණීය සුනිල් අයියා ජීවත්ව සිටියදී නිර්මාණය කළ අවසන් ගීතය වීමද විශේෂත්වයකි. නමුත් මේ ගීතය අද මෙලෙසින් මියුසික් වීඩියෝවක් ලෙස එළි දැක්වී තිබෙන්නේ සුනිල් අයියා නොමැතිවය. මෙම මියුසික් වීඩියෝවේ රූප රචනය වෙනදා මෙන් නිර්මාණය වුවක් නොවේ. ද්විමාන හෙවත් 2D ග්‍රැෆික් ඇනිමේෂන් පරිගණක නිර්මාණයක් ලෙස මෙය නම් කළ හැකියි. ගාලු පාරේ ගීතය එලෙසින් වඩාත් නිර්මාණාත්මක ග්‍රැෆික්කරණයෙන් නිර්මාණය කළ දක්ෂයා කවුද කියලා ඔබ දන්නවාද?**


**ඔහු නමින් රැන්ඩි ක්‍රිස්ටෝෆර් පෙරේරාය. මේ රැන්ඩි යනු ලංකාවට වඩා ජාත්‍යන්ර සංගීත කරළියේ නමක් දිනූ ග්‍රැෆික්කරණයේ නිර්මාණ ශිල්පියෙකි. ලෝ ප්‍රකට 'එමිනෙම්' ඇතුළු සංගීත කණ්ඩායම්වල නිර්මාණවලට දායකත්වය ලබාදී ඇති රැන්ඩි ගාලු පාරේ ග්‍රැෆික්කරණය කළ විදිය මොන වගේද කියා මුලින්ම අපි අහමු.**

**• රැන්ඩි ක්‍රිස්ටෝෆර් පෙරේරා, හෙවත් ලෝකයේ බොහෝ දෙනා ඔබව දන්නේ රැන්ඩි ක්‍රිස් (Randy Chriz) ලෙසයි. රැන්ඩි මීට කලින් කළ වැඩ ගැන කෙටියෙන් කියමු?**


දේශීය වශයෙන් ගත්තොත් රවී ජේ - චරිත අත්තලගේ ඇතුළු මියුසික් වීඩියෝ සම්මාන පවා දිනාගත් නිර්මාණවලට දයක වුණා. නමුත් වැඩි හරියක් නිර්මාණ කරලා තියෙන්නේ ජාත්‍යන්තරවයි. එහිදී 'එමිනෙම්' සංගීත කණ්ඩායමට කළ නිර්මාණ විශේෂයෙන් හඳුන්වන්නත් පුළුවනි.

**• අපි රැන්ඩිගෙ ඒ ජාත්‍යන්තර වැඩ ගැන වෙනත් දවසක කතා කරමු. දැන් අපට කියන්නකො ජිප්සීස්ලගෙ මේ ගාලු පාරේ, නිර්මාණයට ප්‍රවේශ වූ විදිය ගැන?**

සුනිල් අයියා ජීවත්ව සිටියදී එයා හිතාගෙන ඉඳලා තියෙන්නේ මේ ගීතයට අවශ්‍ය රූපරචනය, වීඩියෝකරණය කරන්න. ගාලු පාර දිගේ ගිහින් ෂූට් කරන්න තමයි එයා හිතාගෙන ඉඳලා තියෙන්නෙ. එයාගෙ මනසේ ඇඳී තිබුණු ඒ චිත්‍රය එයා මල්ලි පියල් එක්ක කතා කරලා තිබුණෙ. ජිප්සීස්ලා කලින් කලට කළ නිර්මාණ සියල්ලම හොඳටම හිට් වුණානෙ. ඉතින් සුනිල් අයියා කියලා තියෙන්නෙ එයාලගෙ මේ ගීතයත් ඉතාම හොඳට කළ යුතුය කියලයි. මේකත් හොඳ හිට් එකක් වේවි. විශේෂ එකක් වේවි කියලා එයාලා හොඳට සැළසුම් කරලා කළ ගීතයක්. ඒ නිසා සමහර විට මේක එයාලගෙ අන්තිම හිට් එක වෙන්නත් පුළුවන් කියලා කිව්වලු. කොහොම නමුත් කොවිඩ් එහෙම ආ නිසා මියුසික් වීඩියෝව කිරීමේ කටයුතු පස්සට ගිහින්. ඒ අතරේ සුනිල් අයියා මිය යාමත් එක්ක කලින් සැළසුම් කළ පරිදි එයාලා මේ ගාලු පාරේ මියුසික් වීඩියෝව වීඩියෝකරණය කිරීම අත්හැරලා වෙනත් විකල්පයක් තමයි හොයලා තියෙන්නෙ. ඒ අනුව පියල් පෙරේරා ඇතුළු ජිප්සීස් කණ්ඩායම අවසානයේ තීරණයක් අරගත්තෙ මේක ඇනිමේෂන් (පරිගණක සජීවීකරණ නිර්මාණයක් ලෙස) ඉදිරිපත් කිරීමටයි. ඔන්න ඔය විදියට තමයි මේ වැඩේ මට පැවරුණේ. එයාලා අපට කතා කළේ BNS (භාතිය - සන්තුෂ්ලා) හරහායි.









ඉන්පස්සේ අපි ජිප්සීස්ලාව හමුවන්න දිනයක් දගත්තා. එයාලා අපට මේ ගීතය අහන්න කිව්වා. එයා ඇහුවාම මගේ මනසට ආවේ රසවත් චිත්‍රයක්.

කාර් වෑන් ලොරි අස්සේ
කන්ටේනර් යන්නේ
අලි තඩි බස් මැද්දේ
ත්‍රීවිල් රිංගන්නේ
ඉගිලී ගෙන පිම්මේ
මැති ඇමතිල යන්නේ
නැතිනං අයින් වුනේ
ගුටි කන්නයි වෙන්නේ

මේ විදියට ගීතය අහද්දී චිත්ත රූප මගේ මනසේ මැවුණා.

සුනිල් අයියාගෙ මනසෙ තිබූ යම් යම් අදහස්, රෝස පාට කාර් එක එහෙම එයාම ප්ලෑන් කරලා තිබුණු දෙයක්. ඉතින් එයාලා ඇත්තටම රූගත කරන්න හිතාගෙන හිටිය දේ තමයි අපි 'ඇනිමේෂන්' විදියට කළේ. එයාලගෙ අදහස්වලට අනුව අපේ අදහස් තමයි අපි ඇනිමේෂන් විදියට කළේ.

**• මේ ග්‍රැෆික්කරණය කරන්න කොච්චර කාලයක් ගත වුණාද? මොකද ද්විමාන සජීවිකරණ වැඩක් ඇනිමේෂන් වැඩක් කරන්න සෑහෙන්න හිතන්න වෙනවා වගේම කාලය ගත වෙනවනෙ?**

අපට මාස දෙකහාමාරක් විතර ගියා.

**• ඒ කියන්නේ අසීරු කටයුත්තක්?**

ඔව්. අපට එමිනෙම්ලගෙ නිර්මාණ කරන්නවත් මෙච්චර කාලයක් ගතවුණේ නැහැ. මගේ උදවුවට තවත් මල්ලි කෙනෙක් ඉන්නවා. ඉතින් සමහර තැන්වලදි විතරක් එයත් සහාය වුණා.



පියල් / රැන්ඩි

**• මේ 'ගාලු පාරේ' මියුසික් වීඩියෝව රූගත කරලා කරන්න සිදුවුණා නම් විශාල මුදලක් යන බව පියල් කිව්වා. හැබැයි මේ විදියෙ ඉතා උසස් තත්ත්වයේ ග්‍රැෆික්කරණ කටයුත්තකදීත් ඔබට විශාල මුදලක් යන්න ඇති නේද?**

මේ වෙනුවෙන් ඇත්තටම සෑහෙන මුදලක් වැය වුණා. නමුත් සුනිල් පෙරේරා සහ ජිප්සීස් කියන්නේ ලංකාවේ සංගීත ක්ෂේත්‍රයේ සළකුණක්. ඒ වගේම එයාලට තියෙන ගරුත්වය නිසා වෙනත් වැඩවලදී අය කරන මුදල වගේ අපි අය කරන්න ගියේ නැහැ. අනෙක ලංකාවේ නිර්මාණ අපි බොහොමයක් නොකරන්නෙ විශාල මුදලක් වැය වෙන නිසයි. ඒ නිසා තමයි අපි ජාත්‍යන්තරව අපේ බජට් එකට හරියන වැඩ බාරගන්නෙ. අපේ ඉන්ඩස්ට්‍රි එක ලොකු නැහැනෙ. ඒත් ලංකාවේ අපට වැදගත් කියලා හිතෙන නිර්මාණවලට අපි අපේ දායකත්වය ලබාදෙනවා. අපි මේකට අය කළේ සාමාන්‍යයෙන් අපි ගන්නා මුදලින් හයෙන් එකක වගේ. ඒකත් ඇත්තටම ඉතින් ලොකු මුදලක්. ජිප්සීස්ලාට මේ වැඩේදි අනුග්‍රහය දක්වන්න සිංගර් සමාගම සිටියා. ජිප්සීස්ලා කොහොමටත් ඒ කාලයේ ඉඳලම සිංගර් දැන්වීම් එක්ක කටයුතු කරමින් හොඳ සබඳතාවයක් තියෙනවනෙ.

**• මේ ග්‍රැෆික්කරණයේදී වැඩියෙන්ම අසීරු වූවේ කොතැනද?**

මේකෙ චරිත වැඩියිනෙ. ඒ නිසා මුහුණු හරියට හඳුනා ගන්න පුළුවන් විදියට ඇඳීම අසීරු දෙයක්. සමහර අවස්ථාවලදී ඒ රූපවල කට විවර වෙනවා ගීතය ගයනවා වගේ. ඉතින් ඒවගේ විසි දෙනෙකුගේ විතර ග්‍රැෆික්කරණය කිරීම ඉතා අසීරු දෙයක්. ඒක ඇනිමේට් වෙන අතරෙ ඇත්ත වගේ තියෙන්නත් ඕනැනෙ. 2D ඇනිමේෂන් වගේ දෙයක් තමයි ඒ වෙනුවෙන් යොදා ගත්තෙ.



## පියල් පෙරේරා

**• පියල් අපට කියන්නකො මේ ගීතය ලියුවෙ කවුද?**

අපේ බොහොමයක් ගීත වගේ මේ ගීතය ලියුවෙත් චන්ද්‍රදාස ප්‍රනාන්දු.

**• තනුව?**

මම කළේ. සංකල්පය සුනිල් අයියගෙ. සංගීතය රෙකෝඩ් කළේ දුෂාන් ජයතිලක. ගීතය ගයන්නේ සුනිල් අයියා, මම සහ ජිප්සීස් කණ්ඩායම.

**• ගාලු පාරේ රෙකෝඩ් කරලා කොච්චර කල්ද?**

මට මතක විදියට අවුරුදු හතක් හෝ අටක් විතර වෙනවා. වෙන සිංදුවකට මම මේ මෙලඩි එක හදලා තිබුණා. සුනිල් අයියා කිව්වෙ මල්ලි මේ මෙලඩි එක හොඳයි අපි වෙන එකකට දගමු කියලයි. එතකොට තමයි ගාලු පාරේ කළේ. කොළඹ ඉඳන් ගාල්ලට යන සිද්ධීන් අපිට ගීතයකින් පෙන්වන්න පුළුවන් නම් හොඳයි කියලා සංකල්පය ගැන කිව්වෙ එයා. මේ ගීතය චන්ද්‍රදාස ප්‍රනාන්දු ලිව්වෙත් සුනිල් අයියාගෙ තිබූ අදහස්වලට අනුවයි. ගීතය මේ විදියට කරලා තිබුණත් අවුරුදු පහක් විතර යනකල් අපට මියුසික් වීඩියෝව කරන්න බැරි වුණා. එහෙම කළොත් විශාල මුදලක් යන නිසා වැඩේ ටිකක් පස්සට ගියා. කොළඹ ඉඳන් ගාල්ලට යනකම්ම ෆිල්ම් කිරීමේ අදහස සුනිල් අයියට තිබුණෙ. අපි මේක සාමාන්‍ය විදියට කරමු කියලා මම කිව්වත්, නැහැ මල්ලි සමහර විට මේ ගීතය ජිප්සීස්ලගෙ අවසන් හිට් එක වෙන්න පුළුවන්. ඒ නිසා අපි කරන එක හොඳටම කරමු කීවා. ඒ නිසා තමයි මේකට කල් ගියේ. ඒ වෙනුවෙන් සෑම ප්‍රසංගයකින්ම ලැබෙන මුදලින් කොටසක් මේ වෙනුවෙන් වෙන් කරන්න පවා කටයුතු කළා. කොහොම හරි සුනිල් අයියා නැතිවීම එක්ක අපි මේක ෆිල්ම් නොකර ලෝප්‍රකට ග්‍රැෆික් නිර්මාණකරනයේ ප්‍රමුඛයෙක් වන රැන්ඩි ක්‍රිස්ට්' අපි නොහිතපු විදියට ඉතා විශිෂ්ට නිර්මාණයක් කළා. ඒක තමයි මේ ඔබ රසවිඳින්නේ.

සඳුන් ගමගේ

# නිවී ගිය 'මල් වෙඩිල්ල'

**අද තිබෙන්නේ 'පෙන් ඩ්‍රයිව්' යුගයයි. හැබැයි ඊට පෙර තිබුණේ 'සී.ඩී.' යුගයයි. ඊටත් කලින් මෙරට හතර දිග්භාගය පුරා පැතිර පැවතියේ 'කැසට්' යුගයයි. මට මතක හැටියට ඒ අසූවේ දශකයේ තරම්ය. කැසට් රෙකෝඩරය ගෙදරක් පාසා ජනප්‍රිය වෙද්දී ඊට සාපේක්ෂව කැසට් පටද ජනප්‍රිය විය. ඔන්න ඔය කාලයේ වැඩිම කැසට් පට සංඛ්‍යාවකට එනම් කැසට් පට 113ට ගීත ගැයූ ගායකයෙකු සිටියේය.**

ඔහු නිහාල් නෙල්සන්ය.

ලස්සනට පිපුනු වනමල් ගල්
පීරන දියවැල් - මම ආස කරන
මැණික් කැටේ නිල්
කුක්කු කූක්
එපා එපා මස් කන්නට කිරි අම්මාගේ
කරුණා සුවඳ තවරාලූ හද පියුමේ
මේක ගුණෝ අයියගෙ බජව් දන කාමරේ.

ඔහු ගැයූ දහස් සංඛ්‍යාත ගීත අතරේ මගේ මතකයේ නිදන් වූ ගීත පෝලිමක්, නිහාල් නෙල්සන්ගේ නමත් සමගම සිහිපත් වෙයි.

විනෝද චාරිකාවකට සහභාගි වන හැම කෙනෙක්ම, පැදුරු පාටියකට සහභාගි වන හැම කෙනෙක්ම අනිවාර්යයෙන්ම ගයන ගීතයක්ද මේ අතර වෙයි. ඒ ලස්සනට පිපුනු වනමල්ය.

මේ ගීතය නිසාම දෝ නිහාල් නෙල්සන් සංගීත ප්‍රසංගයකට නැතුවම බැරි ගායකයෙක්ද වෙයි. සැබැවින්ම එදා මෙදා තුර අසීමිත රසික ප්‍රසාදයට පාත්‍ර වූ නිහාල් නෙල්සන්, හැමදාමත් ප්‍රසංග වේදිකාවේ බැබලුණු තරුවක් විය. ඔහු නැති ප්‍රසංගයක් හරියටම පරිප්පු නැති හෝටලයක් වැනිය. එනිසාම දෝ ඔහු නැති සංගීත ප්‍රසංගයක් ලංකාවේ නම් නොමැති තරම් විය.

ලස්සනට පිපුනු ගීතයෙන් පටන්ගෙන මා ඉහතින් ලියූ ජනප්‍රියම ගීත අතරින් තුනක් හතරක් ගයා ඔහු වේදිකාවෙන් බහින්නට හදද්දී වන් මෝ නිහාල් අයියා යැයි රසිකයෝ මහ හඬින් කෑ ගසති. ඒ ඉල්ලීමට සිනාවකින් ප්‍රතිචාර දක්වන ඔහු රසික ඉල්ලීම ඉටු කරමින් තවත් සිංදුවක් ගයන්නේ සල්ලිවලට නම් නොවේ.

එහිදී ඔහු රසිකයන් අමතන්නටද අමතක නොකරයි. පයිප්පයකින් වතුර ගලන්නාක් මෙන් එක දිගටම කතා කරන ඔහු ඇත්තටම චතුර කථිකයෙකි.

අපේ ප්‍රියන්ත කොඩිප්පිලි, කොඩි නමින් කවි පොතක් එළි දැක්වූ දවසේ නිහාල් නෙල්සන් කතාවක් පැවැත්වූ හැටිද මේ මොහොතේ මගේ මතකයට එක් වෙයි. එදා ඔහු කළ කතාවේදී සිංහල භාෂාවේ ඇලපිලි, පාපිලි සමග කොඩිප්පිලි ද එකට සම්බන්ධ කළ හැටි ශ්‍රාවක මුවඟට සිනා එක් කළේය.

කෙලින් කතා කිරීමද නිහාල් නෙල්සන්ගේ අගනා පුරුද්දකි. ඒ නිසාම ගීත ක්ෂේත්‍රයේ අර්බුද පවතින වකවානුවල පත්තරවල අපි නිහාල් නෙල්සන්ගේ අදහස්වලටද ඉඩක් වෙන් කිරීමට අමතක නොකෙළෙමු. ඔහුගේ අදහස් ඒ තරමටම හරබරය. නැවුම්ය.

මොරටුව මහා විද්‍යාලයේ ඉගෙනුම ලබන අවධියේදීම නිහාල් නෙල්සන් ගායනයට හපන්කම් දැක්වීය.

1963 අවුරුද්දේදී 'ලස්සනට පිපුණු වන මල්' ගීතය ගායනා කළ ඔහු, එම ගීතයෙන් රටක් වසඟ කරන්නට සමත් විය. එම ගීතය 1963 මාර්තු 31 වැනිදා දහවල් 12.20ට ගුවන් විදුලියේ වෙළෙඳ සේවයෙන් මුල් වරට ප්‍රචාරය විණි. ඒ මොහොතේ නිවේදන කටයුතු කළ කරුණාරත්න අබේසේකර නිහාල් ගැන කීවේ මෙවැනි කතාවකි.

"මම අද ගෙනාවෙ මල් වෙඩිල්ලක්. මල් ලස්සනට පුපුරලා මල් විහිදුවා බලන අයට චමත්කාරයක් පෙන්නලා බිමට විසි වෙලා යනවා. මම අද ගෙනාව මල් වෙඩිල්ල කවදාවත් බිමට වැටෙන්නේ නැහැ."

ඔහුගේ ගායන දිවියට 2013 වසරේදී වසර 50ක් පිරුණි. ඒ නිමිත්තෙන් කොළඹ මියුසියස් විද්‍යාලයීය ශ්‍රවණාගාරයේදී ප්‍රසංගයක් පැවැත්වුණි. 'අවුරුදු 50යි නිහාල් ඇවිත්' නම් වූ ඒ ප්‍රසංගය නැරැඹීමට දැවැන්ත ප්‍රේක්ෂකාගාරයක් නිර්මාණය වූයේ නිහාල් නෙල්සන් ආදරණීය මිනිසකු බව රටට පැහැදිලි කර දෙමිනි.

ගීත පන් දහසකට වැඩි ගණනකට කටහඬ දුන් මේ අපූරු ශිල්පියා ගැයුවේ බයිලා පමණක්ම නොවේ. ඔහු චිත්‍රපට පසුබිම් ගායකයකු ලෙස ද සාර්ථක වූවේය. පෙම් කුරුල්ලෝ, සක්විති සුවය, ලෝක හොරු, රෝදය, හරියනකොට ඔහොම තමා, මල් වරුසා, වාලම්පුරි, දියමන්ති වැනි චිත්‍රපට නිහාල්ගේ ගී හඬින් රසගැන්වුණු චිත්‍රපටය.

නිහාල්ගේ තවත් රහසක් තිබේ. ඒ, ඔහු ගායකයකු පමණක්ම නොවීය. ඔහු තනු රචකයකු මෙන්ම ගේය පද රචකයකු ද වූවේය.

නිහාල් මොරටු වැසියෙකි. නිකන්ම නිකන් වැසියකු නොවේ. මොරටුවට කීර්තියක් ගෙන දුන් අභිමානවත් වැසියෙකි. එනිසාම ඔහුට 2015 වසරේදී 'මොරටුපුර රත්න විභූෂණ' නමින් සම්මානයක් ද පිරිනැමුණි. ඒ විතරක් නොවේ, ඔහු ජීවත් වන නිවෙසට එන මාවතට ද නිහාල් නෙල්සන්ගේ නම යෙදිණි. ඒ, 2020 ජනවාරි 9 වැනිදාට යෙදුණු ඔහුගේ හැත්තෑ පස් වැනි උපන් දිනය දවසේදීය.


හැබැයි. ඔහු ප්‍රබුද්ධ ලෝකයේදී ඇගයීමට ලක් වූයේ නැත. හේතුව ඔහු බයිලා ගායකයකු වීමය. එසේ වුවත් ඔහු බයිලාවලටම කොටුවූ ගායකයකු නොවන බව ඔහු ගැයූ කරුණා සුවඳ තවරාලූ සහ ලස්සනට පිපුනු වනමල් යන ගීත දෙක නිසා පමණක් වුව මොනවට පසක් වේ. අනික් අතට අද ඇසෙන බොහෝ හරසුන් අරුත්සුන් ගීත අතරේදී එදා නිහාල් නෙල්සන් ගැයූ බයිලා මොනතරම් හරවත්දැයි සිතෙයි. එනිසාම ඔහු ගැයූ එපා එපා මස් කන්නට කිරි අම්මාගේ ගීතය අසා හරක් මස් කෑම නතර කළ උදවිය ගැන කොතෙකුත් අසන්නට ලැබීමෙන්ම නිහාල් ගේ බයිලා හුදෙක් බයිලාම නොවන බවට නිදසුනකි. එනිසාම නිහාල් නෙල්සන්ගේ අගය අපට රටට දැනෙන්නේ අදටත් වඩා හෙටය. එහෙත් ඒ වනවිට ඔහු ජීවතුන් අතර නැත. ඉකුත් අඟහරුවාදා ඔහු ජීවන ගමන අවසන් කර ඔහුට කලින් මෙලොවින් නික්ම ගිය ප්‍රිය බිරිඳ මාලිගේ තුරුලට ගියේය. ඔහු මේ වනවිටත් ඇය සමග ආදරයෙන් හිනාවෙවී ඔරු පදිනවා ඇත.

ශකුවී

සැමරුම්



## නිහාල් නෙල්සන්












## කැසට් 113ට ගී ගයා ලංකාවේ වාර්තාවක්



ඔබ ඇවිත්
අපි හමුවුනොත් ආයේ
අතීතේ ඇස් වලින් වෙන්වූ
කඳුළු මතුවී ගලාවිද රහසේ

සිතට කවියක මිහිර ළං කළ
දුරාතීතෙක ප්‍රේමයක් මියැදී
ඔබේ ඇස් අග ආයෙමත් ඉපදී
ප්‍රේමයේ රස පහස හිත අයදී
ඒ නිසා හමුනොවී ඉමු සොඳුරී

මතක් වී කඳුලකට ඉඩ සැලසී
දෑස රතුවී යාවී දුක ඉතිරී
මගේ ඇස් දෙක දුටුවොතින් ඔහු
හිතේ සැකයක් විය හැකිය ඉතිරී
ඒ නිසා හමු නොවී ඉමු සොඳුරී

ශකුවි

සිතුවම: සමන් කළුබෝවිල



# ‘රිදී රැයක්’ දෙසැම්බර් 18 වෙනිදා

**රිදී තිරය බබලන තරු රංගනයෙන් එක්වන මෙරට විනෝදාස්වාද දර්ශන තලයේ විශිෂ්ටතම රැඟුම් ගැයුම් මුසු වූ ප්‍රාසාංගික වැඩසටහනක් වන ඩයලොග් රිදී රැයක් 2022’ මෙවර අති උත්කර්ෂවත් ලෙස ප්‍රේක්ෂකයන්ගේ සහභාගිත්වයෙන් දෙසැම්බර් 18 වෙනිදා ප.ව 6.30 ට බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීමට නියමිතයි.රිදී රැයක්’ ප්‍රසංගය මෙවර සංවිධාන වන්නේ 20 වෙනි වරටයි.**

වසර ගණනාවක් පුරාවට මෙරට රසික සම්භාවනාවට පාත්‍රවී තිබෙන මෙම විචිත්‍රවත් ප්‍රසංගය සඳහා 8 වෙනි වතාවටත් අනුග්‍රහය දැක්වීමට ඩයලොග් ආසිආටා සමාගම ඉදිරිපත්වී සිටී. 320කට අධික දේශීය සිනමා තාරකාවන්ගේ සුබසිද්ධිය පිණිස කැපවූ සිනෙස්ටාර් අරමුදල ගොඩනැංවීමේ අරමුණින්, සිනෙස්ටාර් පදනම විසින් මෙම ප්‍රසංගය ඉදිරිපත් කරනු ලබයි.ඩයලොග් රිදී රැයක්’ ප්‍රසංගය මඟින් උපයනු ලබන මුදලින් සිනෙස්ටාර් සාමාජිකයන් හට වෛද්‍ය හා ජීවිත රක්ෂණාවරණ පිරිනැමෙන අතර, වියපත් ශිල්පීන් හට මාසික දීමනාවන් ලබාදීමට සිනෙස්ටාර් පදනම කටයුතු කරයි.

සිංහල සිනමාවේ දීර්ඝකාලීන සම්ප්‍රදාය ගෞරවාන්විතව ඉදිරියට රැගෙන යමින් වසර 20 ක් පුරාවට ඉදිරිපත් කරනඩයලොග් රිදී රැයක් 2022’ ප්‍රසංගය සඳහා චන්න උපුලී නර්තන කණ්ඩායම සමඟින් එක්ව විවිධ යුගවල ජනප්‍රිය වූ ගීතයන්ට ආකර්ෂණීය නර්තනාංග රැසක් ඉදිරිපත් කිරීමට වත්මන් රිදී තිරයේ ජනකාන්ත සිනමා තරු රැසක් සැදී පැහැදී සිටිති. මාලිනී ෆොන්සේකා, රවීන්ද්‍ර රන්දෙණිය, ජීවන් කුමාරණතුංග, ක්ලීටස් මෙන්ඩිස්, ශ්‍රියානි අමරසේන,වීණා ජයකොඩි, බන්දු සමරසිංහ, ශ්‍රියන්ත මෙන්ඩිස්, යශෝධා විමලධර්ම, සංගීතා වීරරත්න,චන්න පෙරේරා, අනූෂා දමයන්ති,නිලන්ති ඩයස්, මංජුලා කුමාරි, රොෂාන් පිළපිටිය, සුරාජ් මාපා, පුබුදු චතුරංග,රොෂාන් රණවන, වසන්ත කුමාරවිල, සාරංග දිසාසේකර, චිලී තිලංක, අනුජ් රණසිංහ, ජනිත් වික්‍රමගේ, චතුරිකා පීරිස්, බිමල් ජයකොඩි, දිනක්ෂි ප්‍රියසාද්, සෙනාලි ෆොන්සේකා, උද්‍යාරි පෙරේරා, තාරුකා වන්නිආරච්චි, විනූ සිරිවර්ධන, මාෂි සිරිවර්ධන, ඉරේෂා අසංකි, ශනුද්‍රි ප්‍රියසාද්, මිහිර සිරිතිලක, දුෂේනි ද සිල්වා, තරින්දි ප්‍රනාන්දු, ගයාන් වික්‍රමතිලක, දිනෙත් ද සිල්වා ඇතුළු බොහෝ පිරිසක් මෙම තරු පොකුරට අයත් වෙති.






GLOW COLLAGEN

තාරුණ්‍යය යළිත් කැඳවන කොලැජන් අතිරේකය

“ මම හරිම කාර්යබහුලයි, හැබැයි මම, මගේ පෙනුම, නිරෝගීකම සහ ක්‍රියාශීලි බව ගැන හරිම සැලකිලිමත්. මම මගේ ලස්සන වගේම තරුණකම ආරක්ෂා කරගන්න විදිහ ගැන ගොඩක් හිතනවා. මම ආස නැහැ මගේ සම අවපැහැ ගැන්විලා, ඇස් වටේ කළු වෙලා තරුණකම ටිකෙන් ටික මගේ මුහුණෙන්, මගේ සමෙන් වියැකී යනවට, මට ඕනි මගේ තාරුණ්‍යය ආරක්ෂා කරගන්න. ඉතින් මම දන්නවා මේ දේ කරන්න පුළුවන් සායනිකව තහවුරු කරපු, ප්‍රත්‍යක්ෂ ලෙසම ප්‍රතිඵල තිබෙන කොලැජන් අතිරේකයකට විතරයි කියලා. **එහෙම නිෂ්පාදන එකයි තියෙන්නේ, ඒ ග්ලෝ කොලැජන් විතරයි.**ග්ලෝ කොලැජන් කියන්නේ ඉතාමත් මිහිරි රසයක් වගේම සුවඳකුත් තිබෙන නිෂ්පාදනයක්, ග්ලෝ කොලැජන් හදාගන්නත් හරිම පහසුයි. මම දිනපතා ග්ලෝ කොලැජන් භාවිතා කරනවා. එමගින් මගේ සමේ ලස්සනත්, හිසකෙස් වගේම අස්ථි සහ සන්ධිවල නිරෝගීකමත් දිනපතා වැඩිවෙනවා. ඉතින් ඒ හින්දා ග්ලෝ කොලැජන් කියන්නේ දැන් මගේ හොඳම මිතුරිය. ”






දිවයිනේ සියලුම ෆාමසි සහ සුපිරි වෙළඳසැල් වලින් ලබාගත හැක

සැෂේ පැකට්ටුවක මිල රු 244/-

MEGA We care VERISOL Beauty from Within

077 341 0071 GlowCollagenSriLanka www.megawecare.com

